26/09/2010 - ඉරිදා ලංකාදීප

**සමාජයේ මතය වෙනස් කිරීමෙන් දියුණුව ලැබූ රටවල් - මිලින්ද මොරගොඩ**

මූල්‍ය අංශයේ වෙනස්කම් නිතර ඇතිවෙයි. ජාත්‍යන්තරව පැතිරෙන මෙම වෙනස්කම් රටක පාලනය හා සංවර්ධනය කෙරෙහි ඇති කරන්නේ විශාල බලපෑමකි. ආර්ථිකයේ සංකල්ප වෙනස් වන නමුත් එහි මූලධර්ම වෙනස් වන්නේ නැත. පෙරදිග පමණක් නොව අපරදිග රටවල පවා ආර්ථිකයේ සිදුවන බලපෑම තියුණුය. එහි තීරණ ගන්නා ආකාරය එකිනෙකට වෙනස්ය. ආර්ථිකය සමග, විවිධ සමාජ සමාජය එකතුවන ආකාරය නොයෙක් ආකෘති අනුව විය හැකිය.

ආර්ථිකය අරභයා ඇමරිකාව හැසිරෙන ආකාරයට සහමුලින්ම වෙනස් තීන්දු චීනය ගන්නා බව අද නිරීක්ෂණය කළ හැකිය. සමාජ වලට හා සමාජ පාලනය කරන දේශපාලන ක්‍රම වලට ආර්ථිකයේ වෙනස්කම් ඇති කළ හැකි නමුත් ආර්ථික මූලධර්ම හැම විටෙකම එක හා සමානය. චීනය හා ඇමරිකාව අතර ඇත්තේ තරඟයකි. මතුපිටින් අර්බුද හා මතගැටුම් බහුලය. එනමුත් ආර්ථික වර්ධනය සමග චීනයේ ඇති අතිරික්ත විදේශ මුදල ආයෝජනය කරන්නේ ඇමරිකාවේ භාණ්ඩාගාර බිල්පත්වලය. එකිනෙකට එරෙහිව නැගී සිටින බව පෙනෙන නමුත් ආර්ථික අතින් බැඳෙන මෙම සංකල්පය දැන් ''චිමැරිකා'' ලෙස ආර්ථික විශ්ලේෂකයෝ හඳුන්වති. මේ ආයෝජන අනුව ඇමරිකානු ආර්ථිකය අර්බුදයකට ලක්වුවහොත් චීනය ද අර්බුදයට ලක්වනු ඇත. එසේ නොවන බවට විශ්වාසයක් මේ රටවල් අතර ඇතිවීමෙන්ම මේ මූලධර්ම පොදු බවට සාක්ෂියකි. ලෝකය තුළ තනි ගමනක් පවත්වාගත නොහැකිය. වෙනස්වෙමින් පවතින ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන ධාරාව තුළ ශ්‍රී ලංකාව ද කොටස්කරුවෙකු විය යුතුය. එපමණක් නොවේ සංකල්ප එකිනෙකට වෙනස් නමුත් මූලධර්ම නොවෙනස් බවට ද මෙය හොඳ උදාහරණයකි.

ව්‍යවසායකත්වය මෙම නොවෙනස්වන මූලධර්ම ගැන අවබෝධයක් ඇති කර ගැනීමට හැකි එක ක්ෂේත්‍රයකි. ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් අලුත් අදහස් උවමනා තරම් ඇත. ව්‍යවසායකයෙකු ගේ කාර්ය භාරය ධනය බිහිකිරීමයි. අලුත් ව්‍යාපාරයක් හෝ ආයෝජනයක් මගින් රටට, සමාජයට අවශ්‍ය මුදල් බහුල කිරීම ව්‍යවසායකත්වය මගින් ඉටුකරයි. අතීතයේ පටන් ව්‍යවසායකත්වය සම්බන්ධ සංකල්ප පැවතින. වර්තමානයේ මෙම ව්‍යවසායකත්වය හඳුනා ගන්නේ පුද්ගලික අංශය නමැති ව්‍යවහාරයෙනි. රජයට ව්‍යවසායකයෙක් විය නොහැකිය. එහෙත් ඕනෑම ව්‍යවසායයකට අනුබල දිය හැකිය.

ව්‍යවසායකයන් රටකට වැදගත් ඇයි? ඔවුහු නිරන්තරව ව්‍යාපාර කර්මාන්ත මගින් සමාජය පුබුදුවන නිසාය. රැකියා ඇතිවෙයි. නිෂ්පාදන පැතිරෙයි. වෙළඳ පොළ බිහිවෙයි. මේ නිසා තරඟකාරීත්වයක් ද මහජනතාවට තෝරා ගැනීමේ නිදහස ද හිමිවෙයි. ව්‍යවසායකයන් මගින් රජයට බදු අයකර ගැනීමට අවස්ථාව සැලසේ. මෙම බදු රජයේ වියදමට යෙදවෙයි. එයින් ප්‍රයෝජන ලබන්නේ මහජනතාවයි. රටක ව්‍යවසායකයන් වැඩි වන විට ඒ රටට ලැබෙන බදු ආදායම ඉහල යන අතර එමගින් සමාජ සුබසාධනය හා සංවර්ධන කටුයුතු වෙනුවෙන් රටට අරමුදල් සැපයේ.

ශ්‍රී ලංකාව අවුරුදු පන්සියයකට වැඩි කාලයක් යටත් විජිතයක්ව පැවති කාලය තුළ රටේ ආදායම එකතු කර ගත්තේ අධිරාජ්‍යවාදීහුය. ඔවුන්ගේ වෙළඳ පොළ වෙනුවෙන් අවශ්‍ය දේ මෙරට නිපදවා ගැනීමට පමණක් අධිරාජ්‍යවාදීහු උනන්දු වූහ. ඒ නිසා ඔවුන්ට ලංකාවේ ව්‍යවසායකත්ව බිහිකිරීමට සැලකිල්ලක් තිබුණේ නැත. තම රටට අවශ්‍ය ද්‍රව්‍ය මෙරටින් එකතු කර ගැනීමත්, ඒවා වරාය වෙත ගෙන යාමටත් පමණක් අවශ්‍ය තරමට සකස් කර ගත් ආකල්ප නිසා රට තුළ පූර්ණ පිබිදීමක් සිදු නොවීය. අධිරාජ්‍යවාදී සමයේ ව්‍යවසායකයන් වූයේ ඔවුන්ට අවශ්‍ය එම කණ්ඩායම පමණකි. මෙම පිරිස නිෂ්පාදනයේ කොටස්කරුවන් ද, අලෙවියේ කොටස්කරුවන් ද හා තැරැව්කරුවෝ ද වූහ. කොන්ත්‍රාත් කරමින් බලපත්‍ර ලබා ගනිමින් මෙම කණ්ඩායම අධිරාජ්‍යවාදීන්ගේ අනුග්‍රහය මත ලාභ ඉපැයීය. නිදහස උදෙසා ස්වදේශිකයන් සටන්වදින විට අදිරාජ්‍යවාදීන් කෙරෙහි පමණක් නොව මෙම ව්‍යවසායකයන්ට ද වෛර කරන්නට ලාංකික සමාජය හුරු විය. නිදහස සමග බටහිර සමාජයෙන්ම මෙරටට පැමිණි වාමාංශික සංකල්ප එය තවත් දිරි ගැන්වීය. බ්‍රිතාන්‍ය ඇතුලු යුරෝපීය සමාජයේ කම්කරුවන් පීඩනයට පත් කළ, ඔවුන් සූරාකමින් ලාභ ඉපැයූ දැවැන්ත සමාගම්වලට එරෙහිව ගෙන

ගිය අරගලය වාමාංශික පක්ෂ සමග මෙරටට කාන්දු වීමේ ප්‍රතිඵලය වූයේ ලාංකික සමාජය ද ධනපතියන් හංගවේවා යන සටන් පාඨයට එකතු වීමය.

ජාත්‍යන්තර සමාජය විශාල පරිවර්තනයකට ලක්ව තිබේ. අධිරාජ්‍යවාදී යුගය තුළ ව්‍යවසායකයන් වීමට උවමනාවක් නොතිබුණ ලාංකික සමාජය අදටත් පුද්ගලික අංශය දෙස බලන්නේ කැමැත්තකින් නොවේ. ව්‍යවසායකයා යනු ධනපතියෙකි. සූරාකෑමෙන් ධනය උපයා ගෙන ඇත. යන අදහස් සාමාන්‍යයෙන් පවතී.

එනමුත් ආණ්ඩුව හා එහි ක්‍රියාකාරීත්වය හා සමානව ම පුද්ගලික අංශයේ නොඑසේනම් මේ කියන ධනවාදී ව්‍යවසායකත්වයේ සහභාගීත්වය රටක සංවර්ධනයට වැදගත්ය. ජාත්‍යන්තරය දෙස බලන විට විවිධාකාර අන්දමට ව්‍යවසායකත්වය පැතිරෙමින් තිබේ. පැරණි එනම් අවුරුදු ගණනක් ඉතිහාසයක් ඇති රටවල ව්‍යවසායකත්වය වර්ධනයවීමේ වේගය අඩුය. එයට බලපා ඇත්තේ සමාජයේ එයට එරෙහිව පවතින මත බව තේරුම් ගත හැකිය. අලුත් රටවල ව්‍යවසායකත්වය වේගයෙන් වර්ධනය වෙයි. එවැනි සමාජ රජය හා සමාන්තරව පුද්ගලික අංශයේ ව්‍යවසායකයන් ද විශාල කාර්ය භාරයක් ඉටු කරන බව තේරුම් ගෙන ඇති අතර ඒ නිසාම හැකි උපරිමයෙන් තව තවත් ව්‍යවසායකයන් ට ව්‍යාපාර අරඹන්නට අවස්ථාව සපයයි.

ශ්‍රී ලංකාව නිදහස ලබා දශක හයකට වැඩි කාලයක් ගත වී තිබේ. මෙයින් හරි අඩක්ම වැය කර ඇත්තේ ගැටුම් හා බේධ අවුලවමින්ය. මුලින් දකුණේ කැරළි ඇතිවූ අතර පසුව එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට මුහුණ දෙන්නට රටට සිදුවිය. මේ නිසා විශාල මිළ කළ නොහැකි ජීවිත ප්‍රමාණයක් හා වටිනා දේපොල අහිමිවිය. වඩා අවධානයට ගත යුත්තේ මෙම කලබලකාරී වාතාවරණය හමුවේ රටට අහිමි වු අවස්ථා ගැනය. එය කොතරම් ද යන්න නිසි තක්සේරුවක් කළ හැකි එකක් නොවේ. ගැටුම් නිරාකරණය වී සැනසිලිදායක අවස්ථාවක් උදාවෙමින් පවතින මෙම වකවානුවේ වැඩි අවධානයක්, බෙදුන සමාජය එකතු කිරීම හා ආර්ථිකය නැංවීම කෙරෙහි යොමු කළ යුතුය.

රටක ආර්ථිකය නැංවීම සහමුලින්ම ආණ්ඩුවකට පමණක් කළ හැකි එකක් නොවේ. එහි වැඩි කාර්යභාරයක් ඉසිලිය යුත්තේ පෞද්ගලික අංශයයි. ඕනෑම රටක එය එසේය. ආණ්ඩුව විසින් මූලික අවශ්‍යතා විධි විධාන සම්පාදනය කරන අතර ධනය නිපදවා ව්‍යාපාර මෙහෙයවිය යුත්තේ ව්‍යවසායකයන්ය. ව්‍යවසායකත්ව බිහිවී ධනය නිපදවන විට රජය එයින් බදු අයකරයි. ඒ බදු මුදල් වැය කරන්නේ මහජනතාවගේ සේවය උදෙසාය.

ව්‍යවසායකත්වය සම්බන්ධව මූලධර්ම නියතයක් නමුත් කාලයෙන් කාලයට සංකල්ප වෙනස් වෙයි. විසිවන සියවසේ මුල් භාගයේ ව්‍යවසායකයන් තමන් උපයන ධනයෙන් කොටසක් සමාජ යහපතට වැය කළේය. ව්‍යාපාර හෝ කර්මාන්ත හිමි ව්‍යවසායකයින් තමුන්ම හෝ ඒ වෙනුවෙන් පිහිටුවාගත් සමිති සමාගම් මගින් සමාජ සුබසාධන කටයුතු කරගෙන ගියේය. මේ නිසා ධනය ඉපැයීම හා ඒ ධනය සමාජය තුළ ධනය නැති කොටස් අතර බෙදී යාම පිළිබඳ අවබෝධයක් ඇතිවිය. බොහෝ විට මෙම සමිති හෝ කුඩා සංවිධාන බිහිවූයේ ආගමික පසුබිමක් ඇතිවය. ආණ්ඩු මැදිහත් නොවූ මෙවැනි සුබසාධන වැඩ සටහන් සමාජයේ වඩා ප්‍රචලිත වූයේ යමක් කමක් ඇති ධනවත් පවුල් විසින් කරන සමාජ සත්කාර සේවාවන් වශයෙනි. මේවාට ලැදියාවක් ජනප්‍රියත්වයක් සමාජය තුළ තිබුණි.

පළමුවන හා දෙවන ලෝක යුද්ධ අවසන් වන විට ලෝකය ආර්ථික හා සාමාජීය වශයෙන් වෙනත් රාමුවක් කරා සංක්‍රමණය විය. ධනවත් රටවල් පවා යුද්ධයෙන් හෙම්බත් වී සිටි අතර යුද පරිසරය තුළ කර්මාන්ත හා ව්‍යාපාර අක්‍රමවත් තත්ත්වයකට පත්ව ඇති බව දැකිය හැකි වූ ස්වභාවයයි. මේ නිසා ආණ්ඩුවක් සතු වගකීම පුලුල් හා වෙනස් ආකාරයක් ගත්තේය. මෙතෙක් සමාජයේ සහන ලැබිය යුතු දිළිඳු කොටස වෙන්වෙන් සහන සැපයූ ව්‍යවසායකයන් දුර්වල වී සිටීම නිසා සමාජය ආරක්ෂා කිරීම රජයක වගකීමක් විය. මේ නිසා බිහිවූයේ සුබසාධන රාජ්‍යයන්ය. ආණ්ඩු විසින් ධනය නිපදවීමත් සමාජය රැක ගැනීමත් යන දෙපැත්තටම උරදුන්නේය. සමාජවාදී පමණක් නොව ධනවාදී රටවල පවා මෙම ආකල්ප යෙන් ක්‍රියා කළේය. ව්‍යවසාය මෙහෙයවමින් සමාජ ප්‍රශ්න දෙස බලමින් ආණ්ඩු කිරීම පහසු එකක් නොවේ. මේ නිසා මහජනතාව අපේක්ෂා කරන ප්‍රශ්න සියල්ලටම පිළිතුරු දීමට ආණ්ඩු වලට හැකියාවක් තිබුණේ නැත. රැකියා සැපයීම, ආහාර සැපයීම, අධ්‍යාපනය හා

සෞඛ්‍ය වැනි මූලික පහසුකම් ඉදිරියේ රජය පමණක් වෙහෙසවීම හෙයින් විවිධ සමාජ තුළ නොයෙකුත් ගැටලු හටගැනිණ.

තුන්වන අවධිය උදාවන විට රජය අසමත් හා රජය හා පෞද්ගලික අංශය අතර එකමුතුවකින් ක්‍රියා කළ යුතුය යන සංකල්පය පැන නැංගේය. මෙයින් පෙනී ගියේ ව්‍යවසායකයන් සතු වූ ඉක්මනින් තීන්දුගෙන ධෛර්යයයෙන් හා මහන්සියෙන් ක්‍රියාකිරීමේ බලය යම් ප්‍රමාණයකට බුද්ධිමත් සමාජය තේරුම් ගත් බවයි. මේ නිසා හවුල් ව්‍යාපාර සංකල්පයට ලෝකය පුරා ඉඩක් හිමිවිය. රජයට කර ගත නොහැකි ඇතැම් ව්‍යවසාය රජයේ උවමනාව මත පුද්ගලික ව්‍යවසායකයන් අතට පත් කළේය. රජය දිරි ගැන්වීම් හා සහන සපයන ලද අවස්ථා ද තිබුණි. ඒවා සාර්ථක ලෙස හා උපායශීලීව මෙහෙයවීම හෙයින් රජයේ සුබසාධන කටයුතු වලට යම් සහනයක් ලබා ගන්නට ද අවස්ථාව හිමි වීම සැලකිල්ලට ගත යුතු කාරණයකි. සෑහෙන කාලයක් සුබසාධන ව්‍යාපාර වශයෙන් ගෙන ගිය ව්‍යවසායයන් පුද්ගලික අංශයට පැවරීමෙන් එහි තිබුණ අකාර්යක්ෂම බව අඩු වී රජය දරා ගත යුතු වියදම පහල යාමෙන් සමාජයට දැනෙන වාසියක් ද අත්විය.

මෙහි අත්දැකීම් සහිතව දැන් ජාත්‍යන්තරයේ නව ප්‍රවණතාවක් බිහිව තිබේ. එය සිව් වැනි අවස්ථාව වශයෙන් දැකිය හැකිය. එහි ප්‍රතිපලයක් වශයෙන් රජය හා ලාභ නොලබන ප්‍රජා ආයතන රටාවක් බිහිව තිබේ. ව්‍යවසායකත්වය විසින් ව්‍යාපාර පවත්වාගෙන යයි. මේවායේ ලාභ වලින් කොටසක් රජය ලබා ගෙන යළි සමාජයේ දියුණුවට වැය කරයි. ආණ්ඩු කරන්නේ ප්‍රතිපත්ති සම්පාදනය හා මූලික දර්ශනය සහිත පාලන රාමුව සකස් කිරීමයි. ලාභ නොලබන ආයතන හා ව්‍යවසායකයන් වශයෙන් මෙහෙයවෙන ලාභ ලබන ආයතන මහජනතාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා සපයයි. මේ අතර යම් හිඩැසක් නිර්මාණය වන්නේ නම් රජය ඒ හිඩැස පුරවා සමාජ සුරක්ෂිතතාව තහවුරු කරයි.

මෙම පසුබිම අනුව ව්‍යවසායකත්වය දියුණු කළ ලෝකයේ සියලු රටවල් එහිලා පාදක කරගත් පළමු අරමුණ ධනය බිහිකිරීමයි. ධනය නිපදවිය හැක්කේ පෞද්ගලික අංශයටය. කොමියුනිස්ට්වාදය නිර්මාණය කළ වී. අයි. ලෙනින් ස්වකීය සමාජ දර්ශනය ගොඩනැගුවේ අත්දැකීම් ඇසුරෙනි. ක්‍රමයෙන් සමාජය ගොඩනගන විට ආර්ථිකය සම්බන්ධව පුලුල් අත්ද්‍රැකීම් ලබන්නට ඔහු සමත්විය. එය ඔහුගේ ජීවිතයේ අවසාන කාලයයි. ජීවිත අත්ද්‍රැකීම් සහිතව අවසන් කාලයේ ඔහු නව ආර්ථික ප්‍රතිපත්ති ගැන කතා කළේය. ප්‍රාග්ධනයට මුදල් උපයන්නට ඉඩදෙන්න. රජයට එයින් කොටසක් ලබා ගත හැකිවනු ඇති බව ඔහු සඳහන් කළේය. වාමාංශික අදහස් තිබුණ සියලු රටවල් අද ධනවාදී නැඹුරුවකින් ධනය උත්පාදනය ගැන විශ්වාස කරන්නේ එම නැඹුරුව අනුවය. උපයන ධනයෙන් කොටසක් රජය විසින් ලබා ගෙන සමාජයේ පිහිට රැකවරණය අවශ්‍ය අයට දිය යුතු බව පිළිගනියි. චීනයේ මෙන්ම සිංගප්පූරුවේත් සිදුවන්නේ එයයි. ඕනෑම ආණ්ඩුවට ආර්ථිකය ගැන තීන්දු ගන්නට ශක්තිය තිබේ. එහෙත් ආර්ථික ක්‍රියාවලියෙහි නිරතවන්නට ශක්තිය නැත. ආර්ථික බලවේගය ඇත්තේ පෞද්ගලික අංශය සතුව බව පිලිගත් සෑම රටක්ම වර්තමානයේ දියුණුව කරා ළඟා වී ඇත. සම්පත් මොනවාද ඒවා ආයෝජනය කළ යුත්තේ කවර අවස්ථාවේ ද යන්න වඩා හොඳින් කල්පනාකර නැනවත් තීන්දු ගත යුතුය.

පැවති අන්ධකාර යුගයෙන් පසු ශ්‍රී ලංකාව ඇතුල් විය යුතු මෙම නව මාවතටය. දොස් පවරමින් වැරදි පමණක් දකිමින් සිටි යුගය අවසන් කිරීමට අවස්ථාව උදා වී තිබේ. නීති සම්පාදනයටත්, ක්‍රියාත්මක කිරීමටත් රජයට ඇති හැකියාව ගැන විශ්වාස කළ යුතු අතර ව්‍යවසායකයන් හා පුද්ගලික අංශය විසින් රජයේ රාමුව අනුව ධනය නිපදවන හා සමාජය ඉදිරියට ගෙනයන බලවේගය බව සලකා එයට ඉඩ දිය යුතුය. ලාභ නොලබන සංවිධාන හා සිවිල් සංවිධාන එහි එක කොටසකි. රජයකට වඩා මෙවැනි ව්‍යවසායයන්ට විශාල කාර්ය භාරයක්, වඩා වගකීමකින් ඉටු කළ හැකි බව අද ලෝකය පිළිගනිමින් සිටී. ඇමරිකාව හා බ්‍රිතාන්‍ය ඒ වෙනුවෙන් පෙරමුණ ගෙන ඇත. අධ්‍යාපනය, සෞඛ්‍ය හා සමාජ සුබසාධනය වැනි අංශයන්හි කාර්ය ඉටු කරන සංවිධාන වලට කෙලින්ම රජයේ අරමුදල් ලබා දී වඩා කාර්යක්ෂමව සේවය ඉටු කර ගන්නා මට්ටමට එය පියවරක් ඉදිරියට ගොස් ඇති බව ඒ රටවලින් ලැබෙන තොරතුරු දක්වයි.

ආණ්ඩු යම් කාර්යයක් ඉටු කරන විට එහි ඇති දේශපාලනය, කාර්යක්ෂම භාවය, නාස්තිය, වංචා හා දූෂණ ගැන විවිධ චෝදනා එයි. ආණ්ඩු මැදිහත්වන හැම අවස්ථාවකම අතරමැදියන් බිහිවෙයි.

අවසර හා බලපත්‍ර නිකුත් කිරීම හරහා අනවශ්‍ය පාලන හා දූෂිත පෙලැන්ති බිහිවෙයි. ඒවා ආර්ථිකයට හානිදායකය. ඕනෑම රටක දක්ෂ හා කළමණාකරණය අතින් ඉහල පුද්ගලික අංශයේ ව්‍යවසාය ඉදිරියෙන් සිටී. දැන් තරගකාරී ලෝක ආර්ථික රටාව සමාජය ඉහල තලයකට නැංවීම සඳහා උපයෝගී කර ගන්නේ එම හැකියාවයි. අප රටට ද එවැනි අලුත් අදහස් කාන්දු විය යුතුය. පුද්ගලික අංශය හෝ ව්‍යවසායකයන්, සිවිල් සංවිධාන වලට ඉටු කළ හැකි මෙහෙවර ගැන නිසි තක්සේරුවකට යා යුතුය. ත්‍රස්තවාදය තුරන්වීම, ලෝක ආර්ථික අර්බුදයෙන් මිදීම නිසා අලුත් අවස්ථාවක් උදා වී ඇති බව කියා සිටින නමුත් තවමත් ක්‍රමය ප්‍රායෝගිකව වෙනස් වී නැත. ත්‍රස්තවාදය තුරන් කරන යුධමය පරිසරයේ දී ආණ්ඩුව බලවත් විය. තීන්දු ගත්තේ ආණ්ඩුවයි. බලය තිබුණේ ආණ්ඩුව සතුවය. සාමය ඇති අවස්ථාවේ සමාජයේ බලය පවරා ගත් ආණ්ඩු කළ යුත්තේ තම බලය ආපසු සමාජයට බාර දීමයි. කුඩා ශක්තිමත් ආණ්ඩුවක් විසින් වඩා ව්‍යාප්ත ව්‍යවසායකත්වයක් වෙනුවෙන් අවශ්‍ය යටිතල පහසුකම ඇති කළ යුතුය. සිවිල් සමාජයට හෝ පුද්ගලික ව්‍යවසායකයන්ට ආණ්ඩුව හා කරට කර වැඩ කරන රට දියුණු කරන අවස්ථාව ක්‍රමයෙන් විවර කිරීම වැදගත්ය. වර්තමානයේ මෙරට කැපීපෙනෙන ව්‍යවසායකයන්, සිවිල් සංවිධාන ගණනාවක් හඳුනා ගත හැකිය. ඔවුන් දක්ෂ පිරිසකි. මෙම ජවය රටට සම්බන්ධ කර ගැනීමේ ක්‍රමවේදය වඩා පුලුල් හා පිළිගැනීමක් ඇති එක්ක බවට පත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වටී.

අලුත් ව්‍යවසායකත්ව සේ ම නව අවස්ථා සොයාගැනීම් කරන්නන්ට ද ජාත්‍යන්තර සමාජයේ පිළිගැනීමක් ලැබේ. සමාජය වෙනස් කරන අදහස් ඇති කරන්නේ මෙම නව සමාජ මෙවලම් සොයා ගන්නා කණ්ඩායමයි. පාරිභෝගිකයන් වෙනුවෙන් අලුත් වෙළඳ භාණ්ඩයක් නිපදවන ආකාරයට සමාජයට අලුත් අදහසක් මගින් පරිවර්තනය කළ හැකි නව මතවාද, ආකල්ප බිහිකරන මෙම පිරිස සමාජයේ වෙනසක් ඇති කරයි. වර්තමාන ලෝකය රජය, පුද්ගලික ව්‍යවසායකයන් හා නව මතවාද ඇති කරන නියමුවන්ගෙන් සමන්විත අලුත්ම සංවිධාන ව්‍යුහයක් බව විද්වතුන්ගේ පිළිගැනීමයි. මේ සියලු දෙනාගේ එකමුතුවෙන් හා අදහස් හුවමාරුවෙන් එකිනෙකාගේ වගකීම් ඉටුවන විට සමාජය දියුණු වෙයි. මෙම පරිවර්තන මෙහොත ශ්‍රී ලංකාවේ දියුණුවට ද අධ්‍යයනය කර භාවිතාවට ගැනීම වැදගත්ය.